# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2015

# தேசிய கல்வி ஆணைக்குழு

## வருடாந்த அறிக்கை

2015

# National Education Commission

## Annual Report

2015

නො. 126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - No.126, Nawala Road, Nugegoda

| පටුන | | අංකය |
|---|---|---|


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 02 |
| 2. | කාර්යයන් හා කර්තව්‍යයන් | 04 |
| 3. | කොමිෂන් සභාවේ සංයුතිය | 05 |
| 4. | ඉලක්ක හා කාර්ය සාධන දර්ශක | 06 |
| 5. | කාර්ය සාධන සාරාංශය - 2015 | 07 |
| 6. | අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2015 | 12 |
| 7. | ඇමුණුම් | |
| | ඇමුණුම I - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2015 | 13 |
| | ඇමුණුම II - විසර්ජන ගිණුම - 2015 | 14 |
| | ඇමුණුම III - කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු | 15 |
| | ඇමුණුම IV - විගණකාධිපති වාර්තාව - 2015 | 17 |
| | ඇමුණුම V - ආයතනික ව්‍යුහය | 23 |

## හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

පළමුවන කොමිෂන් සභාව 1991-1996 කාලපරිච්ඡේදය සඳහා පත් කරනු ලැබීය. දෙවන කොමිෂන් සභාව 1996 ඔක්තෝම්බර් 01 වන දින සිට 2001 සැප්තැම්බර් 30වන දින තෙක් ක්‍රියාත්මක විය. තෙවන කොමිෂන් සභාව 2001 ඔක්තෝම්බර් 01 දින සිට 2004 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. හතරවන කොමිෂන් සභාව 2004 ජූලි 01 සිට 2006 මාර්තු වන තෙක් ක්‍රියාත්මක විය. පස්වන කොමිෂන් සභාව 2006 අප්‍රේල් 10 සිට සිය කටයුතු ආරම්භ කරන ලද අතර එහි නිල කාලය 2011 වර්ෂයේ අප්‍රේල් 09 දිනෙන් අවසන් විය. හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී.

**දැක්ම**

ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කෙරෙන්නාවූත් සියළු අභියෝගයන්ට මුහුණ දීම සඳහා යොදා ගත හැකි බව සහ සාධාරණත්වය සහතික කෙරෙන්නාවූත් පරිපූර්ණ අධ්‍යාපනයක් සැමට ලබාදෙන පෘථුල ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම.

**මෙහෙවර**

අධ්‍යාපන පද්ධතියේ සියළු අංශ නොකඩවා පවත්වාගෙන යාම සහතික කෙරෙන්නාවූත් ශ්‍රී ලංකාවේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමේ හැකියාව ඇත්තාවූත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## කාර්යයන් හා කර්තව්‍යයන්

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක ඒම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

## කොමිෂන් සභාවේ සංයුතිය:

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

එසේ වුවද, 2004 වර්ෂයේ පටන් සැහෙන කාලයක් එක් උප සභාපතිවරයෙකු විසින් ඉහත උප සභාපති තනතුරු දෙකම (ප්‍රතිපත්ති හා සැලසුම්) ආවරණය කරනු ලැබීය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 31 දෙනෙකුගෙන් සමන්විතය.

## ඉලක්ක හා කාර්ය සාධන දර්ශක

| | ක්‍රියාකාරකම | අරමුණු | කාර්ය සාධන දර්ශක |
|---|---|---|---|
| 1. | සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම. (2014 සිට අඛණ්ඩව) | සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති යෝජනාවලියක් සම්පාදනය කිරීමට දායකවීම. | සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනය (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම. |
| 2. | 3 වන වර්ගයේ පාසල් පිළිබඳ සමීක්ෂණය හා දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම | ශ්‍රී ලංකාවේ 3 වන වර්ගයේ පාසල්වල භෞතික හා මානව සම්පත් පිළිබඳ තොරතුරු, මූල්‍ය සම්පත් පිළිබඳ තොරතුරු, මූල්‍ය තොරතුරු, ඉගෙනුම් ක්‍රමවේදය ඇතුලත් වන පරිදි දත්ත සහ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම. | බස්නාහිර පලාත් අවසන් වාර්තාව සැකසීම |
| 3. | සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ අධ්‍යයනය (2014 සිට අඛණ්ඩව). | සිංහල භාෂාව භාවිතය පිළිබඳ ප්‍රමිතිකරණය කිරීම. | නිර්දේශ සහිත වාර්තාව සැකසීම. |
| 4. | අ.පො.ස. (උ.පෙළ) සඳහා තාක්ෂණවේදය ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයනය | තාක්ෂණවේදය විෂය ධාරාව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය හා එය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු හා බාධක පිළිබඳ අධ්‍යයනය කිරීම. | නිර්දේශ සහිත අවසන් වාර්තාව සැකසීම. |
| 5. | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා එහිදී සලකා බැලෙන නිර්ණායක පිළිබඳ අධ්‍යයනය. | පද්ධතිය තුළ ගැටළු අවම කිරීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම් හා යෙදවීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම. | නිර්දේශ සහිත අවසන් වාර්තාව සැකසීම. |

## කාර්ය සාධන සාරාංශය - 2015

### 1. හැදින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත නෛතිකව පැවරී ඇති ප්‍රධාන කාර්ය භාරය පහත සඳහන් පරිදි මූලික අංශ තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. සැලසුම් සමාලෝචන හා විශ්ලේෂණය තුළින් දේශයේ අධ්‍යාපන ප්‍රතිපත්ති විවරණය
2. කාලීන අවශ්‍යතාවයන්ට අනුරූපී වන ලෙස පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා නව්‍යකරණය
3. උක්ත සමාලෝචන, විශ්ලේෂණ, විවරණ, නව්‍යකරණ සියල්ල පසුබිම් කොට ගෙන දේශයට ප්‍රශස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම.

උක්ත කාර්යයන් සපුරාලීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුන යටතේ ස්ථාවර කමිටු 3ක් ස්ථාපනය කරනු ලැබ තිබේ.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
2. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

කෙසේ වුවද, 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී. ඒ අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ක්‍රියාත්මක වීම තුළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව ගැටළු ඇති විය. එබැවින්, නැවත අදාළ බලධාරීන් මේ පිළිබඳව දැනුවත් කර 2015.03.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ආයතනයක් බවට පත් විය.

ඉන් පසුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම පිළිබඳව ද ගැටළු ඇති විය. අදාළ පනත අනුව සිදු කළ යුතු ව්‍යවස්ථාපිත තනතුරු සඳහා පත් කිරීම් ප්‍රමාද විය. ( එක් එක් ආයතනයන්හි අදාළ තනතුරු වලට පුද්ගලයන් පත් කිරීම ප්‍රමාද වීම නිසා) එසේම, අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කළ යුතු අනෙකුත් තනතුරු සඳහා පත්කරන ලද සාමාජිකයින්ගේ සේවය අඛණ්ඩව පවත්වා ගනු ලබන්නේ ද එසේ නැතහොත් නව පත් කිරීම් සිදුකරන්නේද යන්න පිළිබඳ ගැටළු ද මතු විය.

මේ පිළිබඳ විමසීමේ දී දැනටමත් සිටින සාමාජිකයින්හට අඛණ්ඩව සේවය කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ අනුමැතිය ලැබුණි. මෙලෙස කොමිෂන් සභාවට සමාජිකයින් පත් කිරීම පිළිබඳ තත්වය නිරවුල් වූයේ 2015 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී ය. මෙවන් පසුබිමක් තුළ 2015 වර්ෂය සඳහා කොමිෂන් සභා රැස්වීම් එකක් පමණක් දෙසැම්බර් මස පවත්වන ලදී. මේ හේතුන් මත 2015 වර්ෂයේ මගහැරුණු කොමිෂන් සභා කටයුතු 2016 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

2015 වාර්ෂික සැලැස්ම අනුමත නොවීම හා ඉහත ස්ථාවර කමිටු පත් කර නොතිබුන ද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2014 වසරේ දී අරඹා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ පහත සඳහන් වැඩසටහන් (ව්‍යාපෘති) 2015 වසරේ දී ක්‍රියාත්මක කරන ලදී.

1. සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය
2. 3 වන වර්ගයේ පාසල් පිළිබඳ සමීක්ෂණය හා දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම
3. සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය කිරීම පිළිබඳ අධ්‍යයනය
4. අ.පො.ස.(උ.පෙළ) සඳහා තාක්ෂණවේදය ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයනය
5. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා එහි දී සලකා බැලෙන නිර්ණායක පිළිබඳ අධ්‍යයනය

1991 වර්ෂයේ සිට ආයතනය සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීම මහා භාණ්ඩාගාරය විසින් සිදු කෙරෙණි. නමුත් 2015 වර්ෂයේ අප්‍රේල් මස සිට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වියදම් සඳහා මුදල් ලබා දීම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කෙරිණි. ඒ අනුව, ගැටළු රාශියක් පැන නැගිණි. එහිදී ආයතනයේ දෛනික කටයුතු සඳහා පමණක් මුදල් ලැබුණු අතර සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලබා දීමක් සිදු නොවුණි.

එහෙත් ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත් වීම නිසා 2015 දෙසැම්බර් මස සිට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත භාණ්ඩාගාරය විසින් නැවත මුදල් ලබා දීම සිදු කෙරිණි.

**1. සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය**

2014 වර්ෂය අවසන් වන විට සකස් කරමින් පැවති සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රතිපත්ති කෙටුම්පත් යෝජනාවලිය 2015 මුල් කාර්තුව වන විට සකස් කර අවසන් කරන ලදී. එය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුව තිබිණි. එහෙත්, කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කර නොසිටි බැවින් අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. නමුත්, 2015 වර්ෂයේ දෙසැම්බර් මස පැවති පළමු කොමිෂන් සභා රැස්වීමේ දී මේ පිළිබඳව සාකච්ඡාවට බඳුන් නොවීය. එය මීලඟ කොමිෂන් සභා රැස්වීමේදී සලකා බැලීමට අපේක්ෂිතය.

**2. 3 වන වර්ගයේ පාසල් පිළිබඳ සමීක්ෂණය හා දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම**

2014 වර්ෂය අවසාන වන විට විශ්ලේෂණය කරමින් පැවති බස්නාහිර, වයඹ හා සබරගමු පළාත් අතුරින් බස්නාහිර පලාත් කලාප 14 හි වාර්තා 2015 වර්ෂයේ මැද භාගයේදී සකස් කරන ලදී. එම කලාප වාර්තාව ඇසුරින් බස්නාහිර පලාතේ 3 වර්ගයේ පාසල් නගා සිටුවීමට අවශ්‍ය යෝජනා සහිත බස්නාහිර පලාත් අවසන් වාර්තාව 2015 වර්ෂය අවසාන වන විට සකස් කර නිම කරන ලදී.

**3. සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ අධ්‍යයනය**

2014 වර්ෂය අවසන් වන විට මුලික කෙටුම්පත් වාර්තාව සකස් කර අවසන් වී තිබුණි. එය සංස්කරණය කිරීම පිණිස විද්වත් මණ්ඩලයක් සමඟ මූලික සාකච්ඡාවන් 2015 වර්ෂයේ මුල් කාර්තුව තුළ සිදු කෙරිණි.

ඉන්පසු මේ සඳහා ප්‍රතිපාදන නොවූයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර 2015 වර්ෂය අවසානය වන විටත් එය සංස්කරණය කර අවසන් වාර්තාව සකස් කිරීමට නොහැකි විය.

**4. අ.පො.ස.(උ.පෙළ.) සඳහා තාක්ෂණවේදය ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයනය**

2014 වර්ෂය අවසාන වන විට දත්ත විශ්ලේෂණය කිරීමේ කාර්යයේ නිරත වෙමින් පැවති මෙම ව්‍යාපෘතියේ අවසාන වාර්තාව 2015 වර්ෂයේ 2 වන කාර්තුව වන විට සකස් කර අවසන් කරන ලදී.

**5. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා එහිදී සලකා බැලෙන නිර්ණායක පිළිබඳ අධ්‍යයනය.**

මෙම ව්‍යාපෘතියේ කෙටුම්පත් වාර්තාව 2014 වර්ෂය අවසානය වන විට සකසා තිබුණි. එහි අවසන් වාර්තාව 2015 වර්ෂයේ පළමු කාර්තුවේදී අවසන් කෙරිණි.

**කාර්ය මණ්ඩල තොරතුරු**

2015.12.31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදිවේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | _ |
| ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 3 | 1 | 2 |
| නියෝජ්‍ය ලේකම් / සහකාර ලේකම් | 1 | 1 | _ |
| ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 4 | 4 | _ |
| පරිපාලන නිලධාරී | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (මුදල්) | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 4 | 2 | 2 |
| වැඩසටහන් නිලධාරී (තොරතුරු) | 1 | _ | 1 |
| කළමනාකරණ සහකාර | 10 | 9 | 1 |
| රියදුරු | 6 | 6 | _ |
| ආරක්ෂක නියාමක | 2 | 2 | _ |
| කාර්යාල සහයක | 4 | 3 | 1 |
| **මුළු** | **38** | **31** | **7** |

**මානව සම්පත් සංවර්ධනය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මේවන විට 31 කි. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණතා සහිත කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වේ.

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය / පුහුණුව පිළිබඳ තොරතුරු - 2015 (2015.12.31 දිනට)**

| | වැඩසටහනෙහි නම | සහභාගී වූ නිලධාරීන්ගේ නම | තනතුර | කාලය |
|---|---|---|---|---|
| 1. | Master of Education at OUSL | එන්.පී.ජේ. හේවගේ මහතා | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | අවු.01 (2015/1-2016/1) |
| 2. | Basic Tamil Course at Department of Official Languages | එන්.පී.ජේ. හේවගේ මහතා<br>ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය<br>ජී.එල්. නිමේෂා මිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර | මාස 06 (2015/6 - 2015/12 |
| 3. | English course at British Council | ඊ.එම්.වයි. සචිත් මහතා<br>ඇලෙක්ස් පිගරාඩෝ මහතා<br>ඩී.ජී.අයි.පී. සෙනවිරත්න මහතා | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | මාස 03 (2015/1-2015/3) |
| 4. | Postgraduate Diploma in Education at University of Colombo | ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | අවු.01 මාස 06 (2015.06 සිට මෙ දක්වා) |
| 5. | Basic Sinhala Course at Department of Official Languages | ඇලෙක්ස් පිගරාඩෝ මහතා | කළමනාකරණ සහකාර | මාස 06 (2015/6 - 2015/12) |

## අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2015

| වැය විෂය අංකය | කාර්යය | වෙන්කළ මුදල (රු.) | වැය කළ මුදල (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | **37,858,000** | **30,755,493** | **81** |
| | **වැටුප** | **21,560,000** | **18,749,481** | **50** |
| 1001 | වැටුප් හා වේතන | 12,500,000 | 10,064,701 | 81 |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | 750,000 | 575,487 | 77 |
| 1003 | වෙනත් දීමනා | 8,310,000 | 8,109,291 | 98 |
| | **ගමන් වියදම්** | **325,000** | **54,600** | **17** |
| 1101 | දේශීය | 150,000 | 54,600 | 36 |
| 1102 | විදේශීය | 175,000 | | 0 |
| | **සැපයීම්** | **2,675,000** | **1,588,191** | **59** |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 425,000 | 146,975 | 35 |
| 1202 | ඉන්ධන හා ළිහිසි තෙල් | 2,000,000 | 1,263,262 | 63 |
| 1203 | නිල ඇඳුම් | 150,000 | 87,959 | 59 |
| 1205 | වෙනත් දීමනා | 100,000 | 89,995 | 90 |
| | **නඩත්තු වියදම්** | **2,550,000** | **1,626,096** | **64** |
| 1301 | වාහන | 1,600,000 | 1,141,684 | 71 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 800,000 | 444,051 | 56 |
| 1303 | ගොඩනැගිලි | 150,000 | 40,361 | 27 |
| | **ගිවිසුම්ගත සේවා** | **10,149,560** | **8,138,681** | **80** |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,350,000 | 1,077,980 | 80 |
| 1403 | විදුලිය හා ජලය | 1,200,000 | 873,964 | 73 |
| 1404 | බදු කුලිය | 5,600,000 | 4,675,000 | 83 |
| 1405 | වෙනත් | 1,999,560 | 1,511,737 | 76 |
| | **මාරුකිරීම්** | | | |
| | **මූලධන වියදම්** | **6,200,000** | **1,628,748** | **26** |
| | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **100,000** | **0** | **0** |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000 | 0 | **0** |
| | **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | **1,100,000** | **941,527** | **86** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 800,000 | 799,447 | **100** |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000 | 142,080 | **47** |
| | **ධාරිතා සංවර්ධනය** | **1,000,000** | **488,357** | **49** |
| 2401 | පුහුණුව හා සංවර්ධනය | 1,000,000 | 488,357 | **49** |
| | **වෙනත් මූලධන වියදම්** | **4,000,000** | **198,864** | **5** |
| 2502 | අධ්‍යාපන අංශය සඳහා ප්‍රතිපත්ති යෝජනා | 4,000,000 | 198,864 | **5** |
| | **එකතුව** | **44,058,000** | **32,384,241** | **74** |

**ඇමුණුම I**

**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2015**

| කේතය | විස්තරය | ප්‍රමාණය | මිල (රු.) |
|---|---|---|---|
| SC | වානේ අල්මාරි | 1 | 11,000.00 |
| COM-KB | පරිගනක යන්ත්‍ර යතුරු පුවරු | 1 | 950.00 |
| DGC | ඩිජිටල් කැමරා | 1 | 61,275.00 |
| COM-LTC | ලැප්ටොප් යන්ත්‍ර | 4 | 380,000.00 |
| COM | පරිගනක යන්ත්‍ර | 2 | 196,000.00 |
| COM_HP | හෙඩ් ෆෝන් | 3 | 4,500.00 |
| COM-UPS | යූ.පී.එස්. | 1 | 4,107.00 |
| COM_PSC | ස්කෑනර් යන්ත්‍ර | 1 | 8,490.00 |
| T_11 | විධායක මේස - රබර් | 1 | 28,500.00 |
| T_20 | පරිගණක මේස | 2 | 9,200.00 |
| C_15 | කැරකෙන ලිපිකරු පුටු | 1 | 4,100.00 |
| FC | ලිපිගොනු කැබිනට් | 3 | 46,500.00 |
| EB-U | ඉලෙක්ට්‍රික් බෙල් | 1 | 2,650.00 |
| VR | හඬ පටිගත කිරීමේ යන්ත්‍ර | 2 | 15,500.00 |
| COMO | කම්පියුටර් මවුස් | 1 | 490.00 |
| BC | බ්‍රීෆ් කේස් | 3 | 19,785.00 |
| EC | එක්ස්ටෙන්ෂන් කෝඩ් | 1 | 1,000.00 |
| COM_SP | ස්පීකර්ස් | 2 | 3,800.00 |
| BP | බෑගය (ලැප්ටොප්) | 1 | 1,600.00 |
| PC | ඡායා පිටපත් යන්ත්‍ර | 1 | 142,080.00 |
| **එකතුව** | | | **941,527.00** |

ඇමුණුම II

## විසර්ජන ගිණුම 2015

ඩී.පී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2015

වියදම් ශීර්ෂ අංකය: 012    අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පුනරාවර්තන | 37,858,000 | - | 440<br>-440 | 37,858,000 | 30,755,493 | 7,102,507 | 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | **37,858,000** | - | - | **37,858,000** | **30,755,493** | **7,102,507** | |
| 1 | මූලධන | 6,200,000 | - | - | 6,200,000 | 1,628,749 | 4,571,251 | 4 |
| | උප එකතුව (මූලධන) | **6,200,000** | - | - | **6,200,000** | **1,628,749** | **4,571,251** | |
| | මුළු එකතුව | **44,058,000** | - | - | **44,058,000** | **32,384,242** | **11,673,758** | |

පිටු අංක 2 සිට 15 දක්වා ඩී.පී.එස්.ඒ 2 සිට ඩී.පී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 16 සිට 20 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/03/14

එඩ්. නිලක්ෂි එන්. ගුණසේකර
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අංක. 126, නාවලු පාර
නුගේගොඩ.

ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 16.03.30

එස්. එම්. ආරියරත්න ද අල්විස්
නියෝජ්‍ය ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

**ඇමුණුම III**

## කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු

හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී. නමුත්, 2015 වර්ෂය ආරම්භයේ පිහිට වූ නව රජය මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. එසේ වුවද ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වීමේදී ගැටළු ඇති විය. එබැවින්, 2015.03.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ආයතනයක් බවට පත් විය.

ඉන් පසුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම පිළිබඳව ද ගැටළු ඇති විය. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව නිල බලයෙන් පත්කළ යුතු සාමාජිකයින් පත් කිරීම ප්‍රමාද විය. ( අදාල ආයතනයන්හි එම තනතුරු වලට පුද්ගලයන් පත් කිරීම ප්‍රමාද වීම නිසා) මේ ආකාරයට කොමිෂන් සභාවට සමාජිකයින් පත් කිරීම පිළිබඳ තත්වය නිරවුල් වූයේ 2015 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී ය.

**එහි සාමාජිකත්වය :**

**සභාපති** : මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා

උප සභාපති : ආචාර්ය ජයන්ති ගුණසේකර මිය

**නිල බලයෙන් පත්වන සාමාජිකයින් :**

| | |
|---|---|
| සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා |
| සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | මහාචාර්ය රජීව විජේසිංහ මහතා |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | ඩබ්ලිව්. එම්. බන්දුසේන මහතා |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | ආර්. එම්. එස්. පී. එස්. බණ්ඩාර මහතා |
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | එච්. ටී. කමල් පත්මසිරි මහතා |

**පත්කරන ලද සාමාජිකයින් :**

පූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන්වහන්සේ

එම්. කිංස්ලි ප්‍රනාන්දු මහතා

ආරියරත්න හේවගේ මහතා

පුෂ්පා කළුබෝවිල මිය

මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා

මහාචාර්ය එස්. සන්දසේගරම් මහතා

ආචාර්ය හිරන්ති විජේමාන්න මිය

මහාචාර්ය දයන්ත විජේසේකර මහතා

**ලේකම්**

පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මිය 2015.02.02 දක්වා

එච්. එන්. එන්. ගුණසේකර මිය 2015.02.16 සිට

**ඇමුණුම IV**

## විගණකාධිපති වාර්තාව - 2015



**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මූළු ප්‍රතිපාදනය හා වියදම**

කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 44.06 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 32.39 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11.67 ක් හෙවත් සියයට 26.49 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

CHECKED

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 37.86 | 30.76 | 7.10 | 18.75 |
| මූලධන | 6.20 | 1.63 | 4.57 | 73.71 |
| **එකතුව** | **44.06** | **32.39** | **11.67** | **26.49** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 01201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1.67 | 0.92 | 0.90 | 1.24 | 6.00 | 2.22 |

**2.3 අග්‍රිම ගිණුම**

කොමිෂන් සභාව යටතේ වූ අංක 7002/0000/00/0256/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.173,824 ක් විය.

**2.4 තැන්පත් ගිණුම**

කොමිෂන් සභාව යටතේ වූ 6000/0000/00/0001/0100/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.37,500 ක් විය.

CHECKED

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

3

**2.5 විගණන නිරීක්ෂණය**

කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.275,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබු ක්‍රියාකාරී සැලැස්ම, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබුණි. පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යසාධනය ඉදිරිපත් කර නොතිබුණි.

**3.2.2 අභ්‍යන්තර විගණනය**

කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.2.3 විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජුනි 9 දිනැති අංක ඩී.එම්.ඒ /2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට එක් වාරය බැගින් රැස්වීම් වාර 4 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එක් කමිටු රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

CHECKED

**3.2.4 කොමිෂන් සභා රැස්වීම් හා ස්ථාවර කමිටු**

ක්‍රියාකාරි සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ රැස්වීම් සහ ස්ථාවර කමිටුවේ රැස්වීම් වාර 12 ක් බැගින් රැස්වීම් වාර 24 ක් පැවැත්විය යුතු වුවද, කොමිෂන් සභාවේ රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

**3.2.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ කාර්යාලය විසින් එම වාර්තා 2016 ජුනි 27 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.4 කාර්යසාධනය**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මට අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා එකතුව රු.5,000,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එහි මූල්‍ය හා භෞතික කාර්යසාධනය පහත පරිදි විය.

CHECKED

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

5

| | ක්‍රියාකාරකම | සලසා තිබුණු ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ළඟා නොවූ ඉලක්ක ගත තත්වය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| (i) | සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 1,000,000 | 182,504 | 817,495 | පර්යේෂණ වාර්තා 10 ක් ඉදිරිපත් කිරීම හා සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය ත්‍රෛයි භාෂාවෙන් ඉදිරිපත් කිරීම |
| (ii) | විශ්ව විද්‍යාල අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 750,000 | - | 750,000 | තාක්ෂණික යෝජනා 8 ක් ඉදිරිපත් කිරීම හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ත්‍රෛයි භාෂාවෙන් ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දැක්වීම |
| (iii) | තෘතියික හා වෘත්තිය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 750,000 | - | 750,000 | පර්යේෂණ වාර්තා 7 එළිදැක්වීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය ත්‍රෛයි භාෂාවෙන් ඉදිරිපත් කිරීම |
| (iv) | 3 වන වර්ගයේ පාසල් පිළිබඳ සමීක්ෂණය හා දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම ( 3 වන අදියර) | 800,000 | - | 800,000 | වාර්තා 9 ක් ඉදිරිපත් කිරීම |
| (v) | ගුරුවරුන් බඳවා ගැනීම් සහ ස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම අතර පරතරය හඳුනාගැනීම | 300,000 | - | 300,000 | අවසන් වාර්තාව පිළියෙල කර නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම |
| (vi) | තාක්ෂණික හා වෘත්තිය පුහුණු පාඨමාලාවලට ඇතුලත්වීම සඳහා ස්ත්‍රී පුරුෂ භාවයේ බලපෑම පිළිබඳ අධ්‍යයනය | 150,000 | - | 150,000 | අවසන් වාර්තාව පිළියෙල කර නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම |
| (vii) | නවක උපාධිධාරීන්ගේ වෘත්තිය හා ප්‍රායෝගික සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය | 110,000 | - | 110,000 | අවසන් වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම |

CHECKED

| | | | | | |
|---|---|---|---|---|---|
| (viii) | ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 140,000 | - | 140,000 | වාර්තා සැකසීම සඳහා කමිටු 9 ක් ස්ථාපිත කිරීම |
| (ix) | ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය | 1,000,000 | 488,357 | 511,643 | අනුමත නව තනතුරු සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම, නියමිත දින වකවානුවල කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම. |
| | **එකතුව** | **5,000,000** | **670,861** | **4,329,139** | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 16 | 12 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 11 | 01 |
| | **එකතුව** | **37** | **31** | **06** |

CHECKED

ඇමුණුම V

## ආයතනික ව්‍යුහය

### Organizational Structure of National Education Commission

